# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1989 අංක 11 දරන

# දේශීය ආදායම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1989 මැයි මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1989 මැයි මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබා ගත හැක

මිල : රු. 1.20 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

1989 අංක 11 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත
[සහතිකය සටහන් කළේ 1989 මැයි මස 15 වන දින]

එල්. ඩී.—ඕ. 13/89.

## 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1989 අංක 11 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තියේ, (අ) ඡේදය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1979 අංක 28 දරන **පනතේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(1) එම ඡේදයේ (xxiii) වන අනුඡේදයේ "යම් මුදල් ආයෝජනයෙන් ලැබූ ලාභ සහ ආදායම" යන වචන වෙනුවට "යම් මුදල් ආයෝජනයෙන් 1989 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර අවසාන වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ලැබූ ලාභ සහ ආදායම" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම ඡේදයේ (xxiv) වන අනුඡේදයේ "ශ්‍රී ලංකා මහ බැංකුවේ" යන වචන වෙනුවට "1989 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර අවසාන වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) එම ඡේදයේ (xxiv) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(xxivඅ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලබන ශ්‍රී ලංකා ආණ්ඩුවේ යම් භාණ්ඩාගාර බිල් පත්‍රයකින්, 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, එම බැංකුවට උපචිත වන හෝ උද්ගත වන යම් පොලියකින් හෝ වට්ටමකින් සමන්විත වන කොටස හැර, ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභ සහ ආදායම වන්නා වූ මුදල් මණ්ඩලයේ ලාභ සහ ආදායම් කොටස;";

(4) එම ඡේදයේ (xLii) වන අනුඡේදයේ "සේවා නියුක්තයන්ගේ භාර අරමුදල" යන වචන වෙනුවට "සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ 1989 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ ලාභ සහ ආදායම" යන වචන ආදේශ කිරීමෙන්;

(5) එම ඡේදයේ (Liii) වන අනුඡේදයේ "රසායන විද්‍යා (ලංකා) ආයතනය, සහ" යන වචන වෙනුවට "රසායන් විද්‍යා (ලංකා) ආයතනය" යන වචන ආදේශ කිරීමෙන් ;

(6) එම ඡේදයේ (Liv) වන අනුඡේදයේ "ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ලාභ සහ ආදායම" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ලාභ සහ ආදායම, සහ"; යන වචන ආදේශ කිරීමෙන් ;

(7) එම ඡේදයේ (Liv) වන අනුඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අනුඡේද එකතු කිරීමෙන් :—

"(LV) (i) 1985 ජනි මස 19 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 'බී' කලාපයේ 2 වන සහ 3 වන උප කලාපවල ;

(ii) 1985 පෙබරවාරි මස 20 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 'සී' කලාපයේ 2 වන උප කලාපයේ ; සහ

(iii) 1986 මැයි මස 26 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 'ජී' කලාපයේ ජනපදිකයාගේ ප්‍රතිලාභය සඳහා යුරෝපීය ආර්ථික හවුලේ මූලාධාර ඇතිව පිහිටුවනු ලැබූ හාර අරමුදලේ ලාභ සහ ආදායම්".

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (ඇ) ඡේදයේ "1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව" යන ඉලක්කම් සහ වචන වෙනුවට "1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 1989 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (iii) වන අනුඡේදයේ "1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1989 මාර්තු මස 31 වන දිනට පෙරාතුව" යන ඉලක්කම් හා වචන වෙනුවට "1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව" යන ඉලක්කම් හා වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වගන්තියේ (1) වන උපවගන්තියේ "1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භව 1989 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන" යන ඉලක්කම් හා වචන වෙනුවට "1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භව 1990 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන" යන ඉලක්කම් හා වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඒ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (ඒඒ) (i) තදබල විරැකියාවක් පවතින ප්‍රදේශයක් වශයෙන් ගැසට් පත්‍රයේ පළ කරන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කොට දක්වා ඇති ප්‍රදේශයක 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ක්‍රියාත්මක කරම් ආරම්භ කරන ලද්දා වූ ද ;

(ii) පුද්ගලයන් දස දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් සේවයේ නියුක්ත කරගනු ලැබ ඇත්තා වූ ද ; සහ

(iii) ශ්‍රී ලංකා ආණ්ඩුවේ ජනසවිය වැඩ සටහන ක්‍රියාත්මක කිරීම භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්තා වූ ද

කෘෂිකාර්මික හෝ කාර්මික ව්‍යවසායක, සේවයේ නියුක්තව සිටින තමාගේ යම් සේවා නියුක්තයකු වෙනුවෙන් සේවා යෝජකයකු විසින්, සේවක අර්ථ සාධක අරමුදලට සහ 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත මඟින් පිහිටුවන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට, ගෙවන දායක මුදල මෙන් දෙගුණයක්.".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම උපවගන්තියේ දෙවන අතුරු වගන්තියේ "එසේම තවදුරටත්" යන වචන වෙනුවට "එසේ වුවද" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම උපවගන්තියේ දෙවන අතුරු වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස් ආදේශ කිරීමෙන් :—

"එසේ වුවද 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල පනතින් පිහිටුවන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සහ යම් අර්ථ සාධක හෝ විශ්‍රාම වැටුප් අරමුදලක බදු අයකළ හැකි ආදායම, 31 වන වගන්තිය යටතේ ඊට හිමිකම ඇත්තා වූ යම් දීමනාවක් එහි ආයෝජන ආදායමෙන් අඩු කිරීමෙන් පසුව, එය විසින් කරන ලද ආයෝජන වලින් ව්‍යුත්පන්න ඒ තක්සේරු වර්ෂය සඳහා වූ ඒ අරමුදලේ ආයෝජන ආදායම් විය යුතු ය :

එසේම තවදුරටත් 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ බදු අය කළ හැකි ආදායම, එම බැංකුව විසින් දරන්නා වූ ශ්‍රී ලංකා ආණ්ඩුවේ යම් භාණ්ඩාගාර බිල් පත්‍රයකින් බැංකුව වෙත උපචිත වන හෝ උද්ගත වන පොලියෙන් හෝ වට්ටමකින් සමන්විත විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඕ) ඡේදයේ (VIII) වන අනුඡේදයට ඉක්බිත්ව ම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

" (IX) 1984 අංක 30 දරන නවීන තාක්ෂණික විද්‍යා පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය පනතින් පිහිටුවන ලද නවීන තාක්ෂණික විද්‍යා පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානයට ; ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියේ (5) වන උපවගන්තියේ "1987 අප්‍රේල් මස හ වන දින හෝ ඉන්පසු ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහාම" යන ඉලක්කම් හා වචන වෙනුවට "1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන ඒනෙත් 1989 මාර්තු මස 31 වන දින හෝ ඉන්පෙර අවසන් වන සෑම තක්සේරු වර්ෂයක් සඳහාම" යන ඉලක්කම් හා වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඇ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඇ වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 32ඇ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය :—

"ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලබන භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධයෙන් බදු අය කිරීමට අදාළ විධිවිධාන.

32ඇ. (1) මේ වගන්තියේ විධිවිධාන ශ්‍රී ලංකා මහබැංකුව විසින් දරනු ලබන ශ්‍රී ලංකා ආණ්ඩුවේ යම් භාණ්ඩාගාර බිල්පත්‍රයක් මත වූ යම් පොලිය කට හෝ වට්ටමකට අදාළ විය යුතු ය. (මෙය මේ වගන්තියෙහි "අදාළ පොලිය හෝ වට්ටම්" යනුවෙන් සඳහන් කරනු ලැබේ.)

(2) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇතද—

(අ) අදාල පොලිය නැතහොත් වට්ටම, (1) වන උපවගන්තියේ සඳහන් යම් බිල් පත්‍ර යක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මිලට ගනු ලැබුවේ—

(i) 1989 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවස්ථාවක නම්, එය පරිණත වන තක්සේරු වර්ෂ යේදී ; සහ

(ii) 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු අවස්ථාවක නම්, එය මිලට ගත් තක්සේරු වර්ෂයේ දී,

එම බැංකුවට උද්ගත වන ආදායම වශයෙන් සැලකිය යුතු වන අතර, අවස්ථාවෝචිත පරිදි එකී බිල් පත්‍රය පරිණත වන නැතහොත් මිලට ගත් තක්සේරු

වර්ෂය සඳහා එකී පොලිය නැතහොත් වට්ටම, මෙහි පහතින් දක්වා ඇති අනුප්‍රමාණය අනුව ආදායම් බද්දට යටත් විය යුතු ය.

(ආ) එම බිල් පත්‍රය, 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු සහ අවස්ථාවෝචිත පරිදි, පරිණත වූ විට හෝ මිලට ගනු ලැබූ විට, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුව සඳහා හෝ වෙනුවෙන් වූ යම් ආයතනයක් හෝ අධිකාරියක් විසින්, එම භාණ්ඩාගාර බිල්පත්‍රය මත වූ පොලියෙන් හෝ වට්ටමෙන් මෙහි පහත දක්වා ඇති අනුප්‍රමාණය අනුව ආදායම් බද්දක් අඩුකර ගත යුතු අතර එසේ අඩු කර ගත් බදු මුදල කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවිය යුතු ය. ඒ සමඟ ගෙවිය යුතු අදාළ පොලියේ හෝ වට්ටමේ දළ ගණන අඩු කරගත් බදු මුදල, හා ගෙවූ ශුද්ධ මුදල පිළිබඳ විස්තර දැක්වෙන ලියවිල්ලකින් වූ ප්‍රකාශයක් ද යැවිය යුතු ය. එසේ යවන ලද මුදල (අ) ඡේදය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙවිය යුතු බදු මුදලින් හිලව් කළ යුතු ය.

| I වන තීරුව<br>භාණ්ඩාගාර බිල්පත්‍රය | II වන තීරුව<br>බදු අනුප්‍රමාණය |
| --- | --- |
| නිකුත් කළ දිනයට පසුව මාස දොළහකින් පරිණත වන යම් භාණ්ඩාගාර බිල්පත්‍රයක් | එම භාණ්ඩාගාර බිල්පත්‍රය මත වූ පොලියෙන් හෝ වට්ටමෙන් සියයට 60 ක්<br>හෝ<br>එම භාණ්ඩාගාර බිල්පත්‍රයේ මුහුණත වටිනාකමින් සියයට 9 ක් යන මේ දෙකින් කවර හෝ අඩු මුදල. |
| නිකුත් කළ දිනයට පසුව මාස හයකින් පරිණත වන යම් භාණ්ඩාගාර බිල්පත්‍රයක් | එම භාණ්ඩාගාර බිල්පත්‍රය මත වූ පොලියෙන් හෝ වට්ටමෙන් සියයට 60 ක්<br>හෝ<br>එම භාණ්ඩාගාර බිල්පත්‍රයේ මුහුණත වටිනාකමින් සියයට 4.5 ක්, යන මේ දෙකින් කවර හෝ අඩු මුදල. |

| | |
|---|---|
| නිකුත් කළ දිනයට පසුව මාස තුනකින් පරිණත වන යම් භාණ්ඩාගාර බිල්පත්‍රයක් | එම භාණ්ඩාගාර බිල් පත්‍රය මත වූ පොලියෙන් හෝ වට්ටමෙන් සියයට 60 ක් හෝ එම භාණ්ඩාගාර බිල්පත්‍රයේ මතු පිට වටිනාකමින් සියයට 2.25 ක්, යන මේ දෙකින් කවර හෝ අඩු මුදල.". |

ප්‍රධාන ප්‍රඥප්තියේ 113අ වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 113අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "මුදල් ආයතනයකින් නිකුත් කරන ලද ආණ්ඩුවේ සුරැකුම් පත්‍රයක් නොවන" යන වචන වෙනුවට "මුදල් ආයතනයකින් නිකුත් කරන ලදුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලබන ආණ්ඩුවේ සුරැකුම්පත්‍රයක් නොවන්නා වූ ද" යන වචන ආදේශ කිරීමෙන්, සහ

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ අන්තිමට පහත දැක්වෙන අනුරූප වගන්තිය එකතු කිරීමෙන් :—

"එසේ වුව ද මෙහි උපලේඛනයේ I වන තීරයෙහි සඳහන් (ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලබන්නා වූ යම් භාණ්ඩාගාර බිල්පත්‍රයක් නොවන්නා වූ) යම් භාණ්ඩාගාර බිල්පත්‍රයක් සම්බන්ධයෙන් මේ උපවගන්තිය යටතේ වූ අඩු කිරීම, ඒ උපලේඛනයේ II වන තීරයෙහි අනුරූප සටහනෙහි සඳහන් අනුප්‍රමාණය අනුව විය යුතු ය.

උපලේඛනය

| I වන තීරය<br>භාණ්ඩාගාර බිල්පත්‍රය | II වන තීරය<br>අනුප්‍රමාණ |
|---|---|
| භාණ්ඩාගාර බිල්පත්‍රය නිකුත් කිරීමේ දිනයට පසුව මාස දොළහකින් පරිණතවන යම් භාණ්ඩාගාර බිල් පත්‍රයක් | එම භාණ්ඩාගාර බිල්පත්‍රය මත වූ පොලියෙන් හෝ වට්ටමෙන් සියයට 20 ක් හෝ එම භාණ්ඩාගාර බිල් පත්‍රයෙහි මතුපිට වටිනාකමෙන් සියයට 2.5 ක් යන දෙකින් කවර හෝ අඩු මුදල. |
| භාණ්ඩාගාර බිල්පත්‍රය නිකුත් කිරීමේ දිනයට පසුව මාස හයකින් පරිණතවන යම් භාණ්ඩාගාර බිල් පත්‍රයක් | එම භාණ්ඩාගාර බිල්පත්‍රය මත වූ පොලියෙන් හෝ වට්ටමෙන් සියයට 20 ක් හෝ එම භාණ්ඩාගාර බිල් පත්‍රයෙහි මතුපිට වටිනාකමෙන් සියයට 1.25 ක් යන දෙකින් කවර හෝ අඩු මුදල. |
| භාණ්ඩාගාර බිල්පත්‍රය නිකුත් කිරීමේ දිනයට පසුව මාස හයකින් පරිණතවන යම් භාණ්ඩාගාර බිල් පත්‍රයක් | වටිනාකමෙන් එම භාණ්ඩාගාර බිල් පත්‍රයෙහි මතුපිට එම භාණ්ඩාගාර බිල්පත්‍රය මත වූ පොලියෙන් හෝ වට්ටමෙන් සියයට 20 ක් හෝ සියයට 0.625 ක් යන දෙකින් කවර හෝ අඩු මුදල.". |

ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඒ වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඒ වගන්තියේ "තැන්පතු මගින් මුදල් භාර ගැනීමේ හා ඒ මත පොලී ගෙවීමේ" යන වචන වෙනුවට "මුදල් භාර ගැනීම තමන් වෙනුවෙන් ම කරනු ලැබුව ද නැතහොත් වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් කරනු ලැබුව ද, තැන්පතු මගින් මුදල් භාර ගැනීමේ හා ඒ මත පොලී ගෙවීමේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තියේ (12) වන උප වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "කොමසාරිස් ජනරාල්වරයා වෙත ලැබුණු දිනයේ සිට අවුරුදු දෙකක් ඇතුළත එකඟත්වයට පත් කරනු ලැබිය යුතු ය. නැතහොත් එකී කාලය තුළ කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය" යන වචන වෙනුවට "කොමසාරිස් ජනරාල්වරයා වෙත ලැබුණු දිනයේ සිට අවුරුදු තුනක් ඇතුළත දී එකඟත්වයට පත් කරනු ලැබිය යුතු ය; නැතහොත් එකී කාලය තුළ කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) "(12) 1987 අප්‍රේල් මස 1 වන දින සිට" යන වචන සිට "ඒ අභියාචනය ලැබුණු දිනය වශයෙන් සලකනු ලැබිය යුතු ය." යන වචන තෙක් වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"(12) 1987 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු මේ වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම අභියාචන පෙත්සමක් ම, එහි අභියාචනය සම්බන්ධයෙන් එකඟත්වයකට පත් වීම හෝ තීරණයක් කිරීම,

(i) ඒ අභියාචනයට අදාළ හෝ ඊට සම්බන්ධ හෝ එයින් උද්ගත වන්නා වූ සහ කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ අභියාචක විසින් තිසි අධිකරණයක් වෙත යොමු කරනු ලැබ ඇත්තා වූ ද යම් කාරණයක් පිළිබඳව ඒ අධිකරණයේ තීරණය මත; හෝ

(ii) (අ) (අභියාචන පෙත්සම කොමසාරිස් ජනරාල්වරයා වෙත ලැබුණේ යම් දිනක ද එදින සිට අවුරුදු තුනක් ඉකුත් වීමට මාස හයකට පෙරාතුව) ඒ අභියාචකට ලියවිල්ලකින් දෙනු ලබන දැන්වීමක් මගින්, තක්සේරුකරුවකු හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් තම කාර්යය කිරීමට නියම කරනු ලැබූ විට අභියාචක විසින්, නැතහොත්

(ආ) කොමසාරිස් ජනරාල්වරයා හෝ තක්සේරුකරුවකු නොවන වෙනත් යම් තැනැත්තකු විසින්,

**යම් ලේඛනයක් සැපයීම හෝ යම් ක්‍රියාමාර්ගයක් ගනු ලැබීම මත**

රඳා පවතින්නේ නම් මිස, එම අභියාචන පෙත්සම කොමසාරිස් ජනරාල්වරයා වෙත ලැබුණේ යම් දිනක ද එදින සිට අවුරුදු තුනක් ඇතුළත, එම අභියාචන පෙත්සම එකඟත්වයට පත් කරනු ලැබිය යුතු ය. නැතහොත් එකී කාලය ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

එම කාලසීමාව ඇතුළත දී එම අභියාචනය එකඟත්වයකට පත් කරනු නොලබන්නා වූ හෝ තීරණය කරනු නොලබන්නා වූ, හෝ යම් අවස්ථාවක එම අභියාචනයට ඉඩ දෙනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව බදු අය කරනු ලැබිය යුතු ය. මේ වගන්තිය යටතේ ලැබෙන සෑම අභියාචනයක් ම ලැබුණු බව දැනුම් දිය යුතු ය. තව ද එසේ දැනුම්දීමේ ලිපියේ දිනය මේ වගන්තියේ කාර්යය සඳහා, ඒ අභියාචනය ලැබුණු දිනය වශයෙන් සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 158 ආ අලුත් වගන්තියක් එකතු කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 158අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්තිය එම වගන්තියේ 158ආ වගන්තිය වශයෙන් බලසහිත විය යුතු ය:—

"කොමසාරිස් ජනරාල්වරයා විසින් තොරතුරු සපයන්නන්ට තෑග්ග ගෙවිය හැකි බව.

158ආ. වෙනත් යම් තැනැත්තකු විසින් එළිදරව් කරනු නොලැබුවා වූ යම් ආදායමක් හෝ ධනයක් තක්සේරු කිරීම සහ ඒ තැනැත්තාගෙන් බද්දක් රැස්කර ගැනීම ප්‍රතිඵලය වන තොරතුරක් සපයන්නා වූ කවර හෝ පුද්ගලයකුට අවස්ථානුගත කරුණු අනුව යුක්තිසහගත යයි තමා විසින් සලකනු ලබන යම් මුදල් ප්‍රමාණයක්, පාර්ලිමේන්තුව විසින් තත්කාර්යය සඳහා විසර්ජන කොට ඇති මුදල්වලින් කොමසාරිස් ජනරාල්වරයා විසින් ගෙවිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම උපලේඛනයේ VIII වන කොටස ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් —

"VIII වන කොටස

රාජ්‍ය සංස්ථා

1989 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රාජ්‍ය සංස්ථාවේ බදු අය කළ හැකි ආදායම මත ................... සියයට 50";

(2) එම උපලේඛනය අන්තිමට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :—

"VIIIඅ වන කොටස

රාජ්‍ය සංස්ථා

1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා.

(ශ්‍රී ලංකා මහ බැංකුව නොවන) රාජ්‍ය සංස්ථා ............... සියයට 50".

16. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන් වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ තුන් වන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) ඒ උපලේඛනයේ 2 වන විෂයය වෙනුවට පහත දැක්වෙන විෂයය ආදේශ කිරීමෙන් :—

"2. පුණ්‍යායතන—

පුණ්‍යායතනවල බදු අය කළ හැකි ආදායම මත—

(i) 1989 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා .................. සියයට 20 ;

(ii) 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා .................. සියයට 10";

(2) ඒ උපලේඛනයේ 12 වන විෂයය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන විෂයයන් ආදේශ කිරීමෙන් :—

"12. සේවානියුක්තයන්ගේ භාර අරමුදල සහ අර්ථසාධක හෝ විශ්‍රාම වැටුප් අරමුදල්—

1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අය කළ හැකි ආදායම මත ................ සියයට 10

13. (ඉහත සඳහන් සහ පළමුවන සහ දෙවන උපලේඛන වල සඳහන් තැනැත්තන් නොවන) තැනැත්තෝ ................ සියයට 20".

17. (1) මේ පනතේ 11 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 113අ වගන්තියට කරන ලද සංශෝධන 1989 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය. අතීතයට බලපෑම.

(2) මේ පනතේ 13 වන වගන්තියෙන්, ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තියට කරන ලද සංශෝධන, 1987 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය. තවද ඒ අනුව 1989 මාර්තු මස 16 වන දිනට ඉහතින් වූ දිනයෙහි තීරණය කිරීමට භාජනව පවත්නා යම් අභියාචනයක්, මේ පනත ආරම්භ වීමට පෙර ඒ අභියාචනය ලැබුණු දින සිට අවුරුදු දෙකක කාලයක් ඉකුත් වීමේ හේතුව නිසාම, ඊට ඉඩ දෙනු ලැබූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

**අනනුකූල තාවක් ඇති වූ විට සිංහල පාඨය බලපැවැත් විය යුතු බව.**

**18.** මේ පනතේ සිංහල හා දෙමළ පාඨ අතර යම් අනනුකූල තාවක් ඇතිවුවහොත් එවිට, සිංහල පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.